Project 116
116 වන ව්‍යාපෘතිය

DP EDUCATION

Coding School

micro:bit

ආරම්භ කරන්න

LIVEWORKSHEETS

micro bit circuit එකෙහි ඇති එක් එක් Inputs භාවිතා කර විවිධ ආලෝක රටා හා වචන display කරමු.

- microbit circuit එකට input ලබා දිය හැකි ආකාර කිහිපයක් ඇත. ඒ අතරින්
  - ✓ A button එක
  - ✓ B button එක
  - ✓ A + B button එක
  - ✓ Circuit එක ඉදිරියට ඇලවීම
  - ✓ Circuit එක පසුපසට ඇලවීම
  - ✓ Circuit එක වමට ඇලවීම
  - ✓ Circuit එක දකුණට ඇලවීම

  කිහිපයකි. ඉහත දක්වා ඇති inputs භාවිතා කර ඒවාට අදාල රටා හා වචන නිර්මාණය කරමු.

- පළමුව ආරම්භයේදීම "Hello! Welcom to micro:bit යන string එක display වීමට පහත පරිදි blocks සකසන්න.

- A button එක press කළ විට "A" අකුර display වීමට පහත පරිදි blocks සකසන්න. මේ සඳහා input tab එක වෙත ගොස් on button A pressed block එක drag කරගන්න. ඉන් පසු පහත පරිදි සකස් කරගන්න. මෙහි show led block එක තුළ ඇති එක් එක් led එක මත click කිරීමෙන් on විය යුතු led එක select කරගත හැකිය. එම led මඟින් A අකුර පත ආකාරයට සකසාගන්න.



LIVEWORKSHEETS

❖ B button එක press කළ විට “B” අකුර display වීමට නිර්මාණය කිරීමට ඉහත පරිදීම input tab එක තුළින් on button A pressed block එක drag කරගන එහි A වෙනුවට dropdown එක මඟින් B select කරගන්න. ඉන්පස් පහත පරිදී code කරන්න.



❖ A හා B button දෙකම press කළ විට “A + B” ලෙස display වීම සඳහා පහත පරිදී code කරන්න. ඒ සඳහා ද on button A pressed block එක drag කරගන එහි A වෙනුවට A + B යන option එක select කරගන්න.

මෙහිදී show leds block තුනක් භාවිතා කර ඇති අතර එකක් display වී මිලි තත්පර 200කට පසු අනෙක් block එක display වීමට නිර්මාණය කර ඇත.



LIVEWORKSHEETS

❖ Microbit circuit ඉදිරිපසට ඇලවීමේදී north දෙසට arrow එකක් display වීමට පහත පරිදි blocks සකස් කරමු. ඒ සඳහා ද input tab එක තුළ ඇති on shake block එක drag කරගන්න. එහි dropdown එක මඟින් logo down යන option එක මේ සඳහා select කරගන්න.



ඉන්පසු එම block එක තුළට show arrow block එක basic tab එක තුළින් drag කරගන්න. එහි side එක north ලෙස select කරගන්න.

❖ Microbit circuit එක පසුපසට ඇලවීමේදී south දෙසට arrow එකක් display වීමට පහත පරිදි නිර්මාණය කරමු. ඒ සඳාහාද ඉහත පරිදීම on shake හා show arrow blocks භාවිතා කරමු.

LIVEWORKSHEETS

- Microbit circuit එක වමට ඇලවීමේදී west දෙසට arrow එකක් display වීමට පහත පරිදි නිර්මාණය කරමු. ඒ සඳහාද ඉහත පරිදීම on shake හා show arrow blocks භාවිතා කරමු.

- Microbit circuit එක දකුණට ඇලවීමේදී east දෙසට arrow එකක් display වීමට පහත පරිදි නිර්මාණය කරමු. ඒ සඳහාද ඉහත පරිදීම on shake හා show arrow blocks භාවිතා කරමු.

LIVEWORKSHEETS